# ථෙරවාදය පිළිබඳ බෞද්ධ විචාරයක්.

මහාචාර්ය ගුණපාල ධම්සිරි.

ලෝකයේ සියළු ආගම් අතර පමණක් නොව සියළු බෞද්ධ නිකායන් අතර ද ථෙරවාදයට අසදෘශ තැනක් හිමි වේ. ථෙරවාදීන් බුදුරදුන්ගේ ධර්මයෙහි ඉතා වැදගත් වූ විශේෂිත ලක්ෂණ දෙකක් ආරක්ෂා කරගෙන තිබේ. එනම් බුදුරදුන් කාලාම සූත්‍රය මගින් දුන් සද්පණිවිඩයයි.[1] එහි අවධාරණයෙන් උගන්වා ඇත්තේ සියළු ම ආකාරයේ ආගමික බලධාරීන්ගේ ඉගැන්වීම් තම තමන්ගේ නුවණින් විමසා බලා සතුටුදායක නම් පමණක් පිළිගත යුතු බවයි. මේ විශිෂ්ඨ ඉගැන්වීම ලෝකයේ පහළ වූ ශාස්තෘන්ගේ ධර්ම අතර අපූර්ව වූ ද අසමසම වූ ද ධර්මයකි. මේ ඉගැන්වීම නිසා ගෞතම බුදුරදුන්ට මිනිස් වර්ගයා අතර හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. මේ නිසා බුදුරාජාණන් වහන්සේ අන්‍ය ශාස්තෘන් අතර කැපී පෙනෙන වෙනසක් ඇති උතුමෙක් බවට පත්ව තිබේ. ලෝකයේ ඇති සියළු ආගම් රඳා පවතින්නේ එම ආගම් කර්තෘවරුන්ගේ ඉගැන්වීම මත ශ්‍රාවක බැතිමතුන් තබන භක්තිය මතය. සෑම ආගමයේම එහි ශාස්තෘවරයාගේ ඉගැන්වීම් විවේචනයට භාජනය කර අභියෝගයට පත් කිරීම අනුගාමිකයෙකු විසින් කළ හැකි ලොකුම පාපයක් බව සළකනු ලැබේ. තමන්ගේ ශාස්තෘ ආධිපත්‍යය විවේචනය කර පිරික්ෂා බැලීමට දිරිදුන් ලෝකයේ එකම ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේය. පරචිත්ත විජානනය නැති විමංශනශීලී භික්ෂු නමක් තථාගතයන් වහන්සේගේ ඉගැන්වීම් විවේචනාත්මකව විමසා උන්වහන්සේ සත්‍යාවබෝධ කළ කෙනෙක්ද නැද්ද යන්න සොයා බැලිය යුත්තේය. තථාගතයන් වහන්සේ ගැන අසා දැනගන්නට ලැබෙන දෙයින්ද, උන්වහන්සේගේ කීම හා ක්‍රියාවන් විමසිලිමත්ව පරික්ෂා කර බැලීමෙන් ද උන්වහන්සේ පිළිබඳව සැබෑ අවබෝධය ලබාගැනීමට හැකිවේ. තථාගතයන් වහන්සේ තුළ අත්තේ ගුණ ධර්ම පමණක් බව ද



දුශ්චරිත නැති බවද ශෘතියෙන් පමණක් නොව තියුණු නිරීක්ෂණයෙන් ද දැනගත යුත්තේය.[2] මෙසේ වදාරා ඇත්තේ එතුමන් තුළ සත්වයන් කෙරෙහි ඇති අපිරිමිත මෛත්‍රී ගුණය නිසාය. උන්වහන්සේ මිනිසුන්ට පෙන්වා දීමට උත්සාහ කළේ තමා මිනිස් තත්වය ඉක්ම වූ දෙවියන්ගේ නියෝජිතයෙක් හෝ මිනිසෙකුට ලබාගත නොහැකි උත්තරීතර තත්වයක් ලබාගත් අයෙකු නොවන බව පැහැදිලි කිරීමටය. එම තත්වය ද අන්‍යයන්ටද ලබා ගත හැකි බව උගන්වන එකම ආගම බුදුසමයයි.

බුදු දහමේ ඇති ඉතාමත් උතුම් අංගය නම් ශාස්තෘවරයාගේ වචන නොවිමසා භක්තියේ පිහිටා ඇදහිය යුතු යැයි නියම කරන ආගමික ආඥාදායකත්වය පිටු දැක තිබීමය. බුදුරජාණන් වහන්සේ සියලු දෙනාගේ අවංකභාවය හා ගුණගරුක භාවයද ගරු කරති. වෙනත් අයුරකින් කියතොත් සියළු සත්වයන් තුළ ඇති බුද්ධත්වය ලබාගැනීමේ අන්තර්ලීන හැකියාව හා පරාර්ථචර්‍ය්‍යා ගුණය පිළිගෙන බුදුරජුහු ඊට ගරු කළහ. පරමාර්ථ වශයෙන් සළකන කල්හි කිසිම සත්වයෙක් වෙනත් අයෙකුට වඩා උසස් යැයි කිව නොහැක. බුද්ධත්වය ලබා ගැනීමේ හැකියාව අන්තර්ලීනව සෑම දෙනා තුළම තිබේ. එය බුදුරදුන් මුලදී පිහිටා සිටි හැකියාවට වඩා වෙනස් නොවේ. සියලු ආගම්වල අනුගාමිකයෝ ඇත්තාහ. විශේෂයෙන් දේව විශ්වාසය මුල් කරගත් ආගම්වල භක්තිය උසස් කර සළකන බැතිමතුන් ඇත. බුදුරදුන් පැහැදිලිවම කියා දුන්නේ ක්‍රියාවෙන් තමා හෝ වෙනත් කෙනෙක් අනුගමනය කළ යුතු නැත කියාය. ලෝකය පිළිබඳ හා පුද්ගලයා පිළිබඳ මේ සත්‍යය පෙන්වා දීම ගැන බුදුන් වහන්සේට මිනිස් සංහතියම කෘතඥවිය යුතුය. මිනිස් වර්ගයා බුදුරදුන් ඉක්මවා යෑමට හැකියාව ඇති නමුත් එක් අතකින් සළකන විට එසේ කළ නොහැක. මක් නිසාද මිනිසාගේ පරම ආධ්‍යාත්මික විමුක්තිය බුදුරදුන් ලබා එය අන්‍යයන්ටද පෙන්වා දී ඇති හෙයිනි. මෙයට වඩා ඉහළ තත්වයකට කිසිවෙකුට යා නොහැක්කේ ඊට ඉහළ තත්වයක් නොමැති බැවිනි.

## වහල් ආගම්

ඉහත විස්තර අනුව සළකන කල ශාස්තෘවරයා භක්තියෙන් පිළිගෙන කටයුතු කරන ආගම් සියල්ල වහලුන්ගේ ආගම් ය. මාර්ක්ස් වාදය වැනි බලධාරී නායකයින්ගේ අණසක අවිවාදයෙන් විමසීමක් නොමැතිව අනුගාමිකයින් පිළිපැදිය යුතු ආඥාදායක ස්වරූපයේ ඒවාය. දේශපාලන සංවිධානවල තත්ත්වයද මෙබඳුමය. ඔවුන්ගේ අනිවාර්යයෙන් පිළිගත යුතු ඉගැන්වීම් නිසා මිනිස් චින්තනයේ හා ප්‍රගතියේ දියුණුව ඔවුහු අවහිර කර දමන්නාහ. මිනිස් සිතේ දියුණුවට ඔවුන්ගෙන් සිදුවන විනාශය අප නිරන්තරයෙන් අවබෝධ කරගෙන සිටිය යුතුය. ධනේශ්වර වාදය මිනිසාගේ ශරීරයේ ශ්‍රමය සූරා ගනීයි. ඒකාධිපති දේශපාලන ධර්ම හා ඒකාධිපති බලතල දරන ආගම්වලින් මිනිසාගේ සිත හා සිතීමේ ශක්තිය සූරා කනු ලබයි. මිනිසාගේ තත්වය යටහත් පහත් අනුගාමිකයෙකුගේ තැනට පත් කිරීම නිසා බුදු කෙනෙක්, සර්වබලධාරී දෙවියෙක් හෝ මාර්ක්ස් කෙනෙක් වීමේ හැකියාව වසා අවහිර කර දමයි. ඔවුන් අභිබවා යාම ගැන කියනුම කවරේද![3] එහෙත් ථෙරවාදී බුදු දහමද දුවන්නන් වාලේ දුවන දේශකයන් කියන දේම අදහන තත්වයකට වැටී සිටීමක් දක්නට ලැබේ. එය කනගාටුවට කරුණකි. බුදුරජාණන් වහන්සේ මහ දැනමුත්තෙක් කරගෙන තිබේ. ත්‍රිපිටක පාඨයකින් සත්‍යතාවය සනාථ කළ නොහැකි කිසිම සත්‍ය ධර්මයක් ප්‍රකාශ කිරීම අවහිර කර තිබේ. ආචාර්යවාදයට හා සම්ප්‍රදායට මුල් තැන හා ප්‍රමුඛත්වය දීම නිසා බුදුරදුන් අනුදැන වදාළ නිදහස් චින්තනය අවලංගු වී තිබේ.

## කාලාම සූත්‍රය

ථෙරවාදී ඉගැන්වීම දායාද කොට සිටින අපට අපේ ආචාර්යවාද හා සම්ප්‍රදාය විවේචනය කිරීමට හා විමර්ශනය කිරීමට අයිතිවාසිකමක් ඇති බව අමතක කළයුතු නැත. තම ශාස්තෘවරයා කෙරෙහි ඇති භක්තිය හා ගෞරවය නිසා ඔහුගේ ඉගැන්වීම් විචාරයෙන් තොරව පිළිගත යුතු නැති බව බුදුරදුන් කාලාම සූත්‍රයේදී දේශනා කළහ. මේ අවසරය වෙනත් කිසිම



සමය ශාස්තෘවරයෙක් සිය අනුගාමිකයින්ට දී නැත. බෞද්ධෝපාසකයෙක් වන්නේ බුදුරදුන් කෙරෙහි අන්ධ භක්තිය ඇති කර ගැනීමෙන් නොවේ. එබැවින් ථෙරවාදී බෞද්ධයන් වශයෙන් අපේ යුතුකම වන්නේ අපේ සම්ප්‍රදායික ඉගැන්වීම් විවේචනාත්මක ලෙස පරීක්‍ෂා කර බැලීමය. මෙසේ කිරීම දැන් කාලෝචිත අවශ්‍යතාවයක් වී තිබේ. එසේ වන්නේ අපේ සාම්ප්‍රදායික ඉගැන්වීම්වල වර්තමානයට නොගැළපෙන ප්‍රශ්න ඉස්මතු වී තිබෙන බැවිනි. යම්කිසි ධර්මයක් ඉදිරියට ගෙන යෑමට නම් මෙවැනි විචාරත්මක ආකල්පයක් අවශ්‍ය වේ. අඛණ්ඩව ඉදිරියට ගලා යන චින්තන විප්ලවයක් මේ සඳහා අත්‍යවශ්‍ය වේ. සංඝයාගේ උපෝසථ කර්මයෙන් සමාජයට ලබාගත හැකි ආදර්ශය මෙයයි. ගෝකුලදාස පඬිතුමා පෙන්වා දී ඇති අයුරු දීර්ඝ කාලයක් සංඝ සමාජය ශක්තිමත්ව පවත්වා ගෙන එන්නට හැකි වූයේ මේ නිසා ය.

මා මෙහි නිර්දය ලෙස දක්වා ඇති සමහර කරුණු පාඨකයා ප්‍රවේසමෙන් පිළිගත යුතුය. මනුෂ්‍යයින් ගැන පොදුවේ ඒකාකාරී ලෙස සළකා බැලීම සාවද්‍ය බව අපි දනිමු. සියලු සත්වයින් තුළ බුද්ධ බීජය හෙවත් බුදුවීමේ අන්තර්ලීන ශක්තිය තිබේ. එම නිසා ඕනෑම සමාජයක අව්‍යාජ ආගමික හැඟීම් හා ආකල්ප තිබිය හැක. මේ බුද්ධ බීජය දියුණු වන ප්‍රත්‍ය, එනම් පරිසරය හා ධෛර්ය ඕනෑම ආගමකට ම ලබාදිය හැකිය. සාම්ප්‍රදායික ඉගැන්වීම්වල මූලධර්මවලට විරුද්ධව යන ආකාරයද පැහැදිලි කළ හැකිය. ඒ නිසා සාම්ප්‍රදායික ඉගැන්වීම් විමසා පරීක්‍ෂා කර බලා බෞද්ධ න්‍යාය ධර්මයන්ට පටහැනි නොවන ආකාරයෙන් නැවත සකස් කරගත යුතුය. මෙහිදී අනිවාර්යයෙන් ම පිළිගත යුතු සත්‍ය ප්‍රකාශ කරන්නේ යැයි අදහස් නොවේ. එවැනි මතයක් ඉදිරිපත් වුවහොත් අපද මූලධර්මවාදී නොවරදින සුළු ආචාර්යවරයෙකුගේ තත්වයට පත්වේ. මෙහිදි වැදගත් වන්නේ බුදුරදුන් වදාළ බෞද්ධ න්‍යාය මිනිස් වර්ගයාගේ සුභ සිද්ධියට යොදා ගන්නා ආකාරයයි.

බොහෝ කරුණුවලදී ථෙරවාදය බුදුරදුන්ගේ ධර්මයට පටහැනි වී තිබේ. ථෙරවාදී ඉගැන්වීම්වල තිවන් ලබාගැනීම මෛත්‍රීය බෝධිසත්වයන්ගේ පැමිණීම තෙක් කල් දමා ඇත.

එතෙක් අප දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳිය යුතු බවට අනුබල දීමක් කර තිබේ. ථෙරවාද සම්ප්‍රදායේ පිංදීමේ වාක්‍යයෙන් මේ බව ප්‍රකාශ වේ. මෙය සතිපට්ඨාන සූත්‍රයේ දේශිත මෙලොවදීම නිවන් ලබාගැනීමේ උපදේශයට පටහැනිය. මතු අනාගතයේදී නිවන මෛත්‍රිය බුදුන්ගෙන් ලබාගැනීමට උත්සාහ කිරීම බුදුරදුන්ගේ බුද්ධිවාදී මාර්ග ශක්ති ක්‍රමයට පටහැනිය. භක්තියෙහි පිහිටා නිවන් දැකීම අනාගතයේදී ලබාගත යුතු යැයි කීම නිවන කල් දැමීමේ උපක්‍රමයකි. තවද බහුල වශයෙන් ඇති ථෙරවාදී මතයක් නම් මෙකල නිවන් දැකිය නොහැක යන ආකල්පය කරුණු දෙකකින් සළකා බලන කල සාවද්‍ය බව කිව යුතුය. කාලය පිළිබඳ සංකල්පය මිනිසාගේ මනසින් මවා ගන්නා ලද්දකි. එබැවින් කාලය නිර්වානවබෝධයට අදාළ නොවේ. නිර්වානය යනු මනසෙහි මායාකාරී බව අවබෝධ කරගෙන එය ප්‍රතික්ෂේප කිරීමකි. ථෙරවාදේ දෙවැනි වැරද්ද නම් සංසාරයට රුචියක් ඇති කර නිවන් දැකීම පමා කර දෙව් මිනිස් සැප විඳීමට අනුබල දීමය. දිගු කලක් තුළ දෙව් මිනිස් සැප විඳ අවසානයේදී මෛත්‍රිය බුදුන් දැක නිවන් ලබා ගනු මැනවි? යන පිංදීමේ වාක්‍යයෙන් පෘතග්ජනයා තුළ ඇති ආශාවම ධර්මයට හරවා කියා දීමකි. මෙය තමාගේ තත්වය පහත් කරදමා ගැනීමකි. බුද්ධ දේශනාවේ නියම අරමුණට හා බෞද්ධයා තුළ තිබිය යුතු ආකල්පයට විරුද්ධ වූවකි. නිර්වානය කාලයට සම්බන්ධ නැත. එය අකාලිකය. නුවණැත්තන් විසින්. අවබෝධ කළ යුත්තකි. (පච්චත්තං වේදිතබ්බො විඤ්ඤුහි) ථෙරවාදයට නිර්වාන සංකල්පය පටුය. දුර්වලය. එබැවින් එහි අන්තිමරහතන් වහන්සේ සොයා ගැනීමට අවුරුදු දෙදහසක් පමණ අතීතයට යා යුත්තේය.

## නිවන හා ප්‍රව්‍රජාව

ථෙරවාද සම්ප්‍රදායෙහි බහුල වශයෙන් පවතින මතයක් නම් නිවන් දැකීම පිණිස සසුනේ පැවිදි විය යුතු බවය. ඔවුන්ගේ මතය මෙසේය. "නිර්වානය ක්ෂාත් ක්ෂාත් කළ හැක්කේ භික්ෂූන් වහන්සේ කෙනෙකුගේ භාවිතා වූ සිත තුළින්මය. සිංහ තෙල් දැරිය යුත්තේ රන් බඳුනක පමණක් මෙනි" යනුයි. ගෘහස්ථයන් නිවන් අවබෝධ කළ හොත් ඔහු දින හතක් ඇතුලත කාලක්‍රියා කරන්නේය. මේ මතය වැරදි බව පෙනෙන්නේ බුදුරදුන් ජීවමාන



සමයෙහි තප්සසුහල්ලුක, අනාථපිණ්ඩික වැනි ගිහියන් ගණනාවක් නිර්වානය අවබෝධය කළ බැවිනි. විවිධ සූත්‍රවල එවැනි පුද්ගලයන් විසි එක් දෙනෙකුගේ නම් සඳහන් වී ඇත.[5] මෙවැනි ඉගැන්වීමක් බුද්ධ වචනවල දක්නට නොලැබේ. පසේ බුදුවීම පවා ගිහියන්ට හැකි බව උන්වහන්සේ සඳහන් කර ඇත. එබැවින් භික්ෂූන් විසින් ප්‍රචාරය කර ඇති මේ මතය තමන් වරප්‍රසාද ලත් පිරිසක් බව මහජනයාට පිළිගැන්වීම සඳහා ගන්නා ලද ප්‍රයෝගයකි.

## පුරුෂාධිපත්‍ය සංකල්පය හා මෙහෙණි සස්න

ථෙරවාදේ ඇති තදබල දුර්වල කමක් නම් එහි ඇති පිතෘමූලික සමාජයීය ආකල්පය දරන පුරුෂාධිපත්‍ය සංකල්පයයි. සෘජුවම ථෙරවාදය පිට මෙම වරද ආරෝපණය කළ නොහැකිය. එය ඇති වුණේ ථෙරවාදය බිහි වූ සමාජයේ ආකල්ප හා චින්තන රාමුව තුළ බැවිනි. නමුත් වර්තමාන සමාජයෙහි මෙය ලොකු සමාජ ගැටළුවකට මහ පාදා දී තිබේ. එබැවින් ථෙරවාදයට මෙම ප්‍රශ්නයට මුහුණ නොදී එය යටපත් කළ නොහැකිය. මේ නිසා සමාජ සාධාරණය හා බුද්ධ දේශිත සාමානාත්මතාව, මෛත්‍රී කරුණා ආදි ගුණධර්ම පලුදු වී යන්නේය. ආගමක් මෙවැනි මානවවාදී ප්‍රශ්න ගැන වඩාත් සැළකිලිමත් විය යුතුය. එසේ වන්නේ සමජය මිනිසාට හොඳ නරක හා යහපත් ගුණධර්ම උගන්වන්නේ ආගමක් මගින් බැවිනි. මේ ප්‍රශ්නය වඩාත් කැපී පෙනෙන්නේ ථෙරවාදී සම්ප්‍රදාය ස්ත්‍රීන්හට මහණ උපසම්පදාව දීම වැළැක්වීමට උත්සහ ගන්නේ ඇයිද යන්න සළකා බැලීමෙනි. ථෙරවාදී රටවල දැන් භික්ෂුණී ශාසනයක් නැති බැවින් මෙය නොකළ හැකියයි දැඩි මත ධාරී ථෙරවාදී ඇදුරෝ කියති. එහෙත් චීනය, කොරියාව වැනි මහායාන රටවල භික්ෂුණී ශාසනය අඛණ්ඩව පැවත එන්නේ සිංහල භික්ෂුණී පරම්පරාවෙනි. ථෙරවාදය වඩාත් වැදගත් යැයි සළකන්නේ සම්ප්‍රදායද නැතහොත් තම මව් පක්ෂයේ කාන්තාවන්ගේ සමානත්වය පාදා ගැනීමට භික්ෂුණී ශාසනය නැවත පිහිටුවීමද? සිංහල ස්ත්‍රීන්ගේ සසර දුක් ගෙවා නිවන් සැපත ලඟා කර දෙන භික්ෂුණී ශාසනය නැවත

පිහිටුවීමද? සිංහල ස්ත්‍රීන්ගේ සසර දුක් ගෙවා නිවන් සැපත ලබා කර දෙන භික්ෂුණී ශාසනයට ඔවුන් විරුද්ධ නොවිය යුතුය. කරණීයමෙත්ත සූත්‍රයෙහි දක්වා ඇති අයුරු මෛත්‍රිය ප්‍රතිමූර්තිය නම් මවක් තමන්ගේ එකම පුත්‍රයා රැක බලා ගන්නා ආකාරයයි. පුත්‍රයින්ද තම මවට එම ආකාරයෙන් කරුණා මෛත්‍රිය දක්වා ප්‍රති උපකාර නොකරන්නේ නම් එය ඔවුන්ගේ ගුණ ධර්ම වල ඌණතාවකි. අපේ මෑණිවරුන්ට මේ කරන අපරාධය පංචානන්තරිය කර්මයකට සමාන කළ හැකිය. මෙසේ ඔවුන් මරා දැමීම සුළු පටු පාපකර්මයක් නොවේ. මවක් තම දරුවාට කිරි පෙවීම ප්‍රතික්ෂෙප කිරීම ඔහුගේ මරණයට මග පාදවන්නක් මෙන්ම මවගේ නිවන් මගට බාධා පමුණුවා සසුනේ පැවිදිවීමට අවහිර කිරීම ඔවුන්ගේ සංසාර විමුක්තිය අවහිර කිරීමකි. තම මෑණිවරුන්ට කරන මේ අපරාධය යුක්ති සහගත යයි කීමට ථෙරවාදී ඇදුරන් හේතු හා යුක්ති සොයන්නේ ඇයි දැයි ඔවුන්ම ආත්ම විමර්ශනයක යෙදිය යුතුය. අනුන්ගේ දුක් ගැන නොතැකීමත් සසර දුකින් නිදහස් වීමට අතහිත නොදීමත් ථෙරවාදීන්ගේ මෛත්‍රිය කරුණාව වැනි ගුණධර්මවල ඌණතාවයක් නොවන්නේද? අද ලක්දිව සමාජයේ අනුන්ගේ දුක් ගැන නොතකන ත්‍රස්තවාදය යුක්ති සහගත යැයි සිතිමේ ආකල්පයක්ද දක්නට ලැබේ. පරදුක්ඛ දුක්ඛිතවීමේ මහළු බෞද්ධ ආකල්පයට අප පිටු නොපා අපේ බෞද්ධකම රැක ගත යුතුය.

අපේ මව් පක්ෂයේ සංසාර විමුක්තිය පිණිස ඇති උනන්දුව උත්සාහය අපේ ආගමික සම්ප්‍රදායෙන් ඉටු කර සපුරාදීමට නොහැකි නම් අපේ ආගමෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද? බුදුරජාණන් වහන්සේ සැකයෙන් තොරව කාන්තාවට නිවන් අවබෝධ කළ හැකි යැයි පවසා තිබේ. එසේම මෛත්‍රිය ගුණ ධර්මයේ උච්චතම අවස්ථාවට නිදර්ශනයක් වශයෙන් බුදුරදුන් දැක්වූයේ මාතෘ ප්‍රේමයයි. එබැවින් ගුණ ධර්ම ක්ෂේත්‍රයේ බෞද්ධයින්ගේ මෛත්‍රීයේ ප්‍රතිමූර්තිය මෑණියන් වහන්සේය. බෞද්ධ ගුණ වගාව මාතෘ මූලික එකකි. බෞද්ධ චින්තනයට අනුව ගෙදර බුදුන් අම්මාය. තාත්තා නොවේ. මේ සංකල්පය මහායාන බුදුසමයේ මූර්තිමත් වන්නේ ප්‍රඥාවේ උපරීම තත්වය ප්‍රඥා පාරමිතා නැමති දෙව්දූවකට පිරිනමා තිබීමෙනි.



ථෙරවාදීන්ට සම්ප්‍රදාය තමා විසින් පිරිය යුතු උසස් ගුණ ධර්මවලට වඩා උසස්ද? බුද්ධ අවවාදය වී ඇත්තේ 'මා පරම්පරාය මා පිටකසම්පදාය' යන වචන තුළින් කාලාම සූත්‍රයේ ඉගැන්වීම්ය. එසේනම් ආචාර්ය පරම්පරාව අවිචාරයෙන් කරපින්නා ගත යුතු නැත.. තම බණ පොත්වල ඇති කරුණුද එලෙසම අවිචාරයනේ පිළිගත යුතු නැති බව භාග්‍යවතුන් වහන්සේ අපට උගන්වා ඇත. එබැවින්ම මෙහිදී ථෙරවාදී සම්ප්‍රදාය බුද්ධ වචනයට පටහැනිව ක්‍රියා කරන බව කිව හැකිය.

## කුලභේදය පිළිගැනීම හා රැකීම

ථෙරවාදයේ දැකිය හැකි තවත් දුර්වල කරුණක් සළකා බැලිම වටී. ථෙරවාදයෙහි හා අධර්මයෙහි සම්බන්ධතාවයක් තිබේද යන්න යි ඒ. ලක්දිව ථෙරවාද සහ පරපුර කුලභේදය පිළිගෙන එය රැකිය යුතු යහපත් සමාජ චාරිත්‍රයක් ලෙස පිළිගෙනකටයුතු කරන අයුරු පෙනේ. මෙහිදී අනුන්ගේ දුක් වේදනා සිත් තැවුල් ගණන් නොගෙන මග හරින දුර්ගුණය කැපී පෙනෙයි. බෞද්ධයෙක් වීමට පෙර මිනිසෙක් තුළ මිනිස් ගුණ ධර්ම තිබිය යුතුය. කුලභේදය පිළිගෙන එය රැකීම හා රැකීමට අනුබල දීමෙන් මිනිසා මිනිස් කමෙන් ඈත් වී තිරශ්චීන තත්වයකට පත් වී පරිහානිය කරා ගමන් කරයි. මෙය බුද්ධ පුත්‍ර සංඝ සමාජයේ දක්නට ලැබීමෙන් එය පිළිගෙන තිබීමෙන් පමණක් නොව ගුණධර්ම ගරු කරන්නන්ද එය පිළිගෙන තිබෙන බව මහජනයාට පෙනී යයි. ඇත්ත වශයෙන්ම එම නිසා කුලභේදය ආගම හා සම්බන්ධ ශුද්ධ ධර්මයක් ලෙස පිළිගැනීමට ලක්වේ. කුලභේදය ඉතා දරුණු සමාජයක පරිහානි කර සමාජ ලක්ෂණයක් ලෙස බුදුරජාණන් වහන්සේ අවධාරණයෙන් වදාළහ. එය අසාධාරණය, සාවද්‍ය යැයි දේශනා කළහ. එපමණක් නොව ප්‍රායෝගිකවද ආදර්ශ දෙමින් කුලභේදය නොසළකා සංඝ සමාජය ඇති කළහ. බුදුරජාණන් වහන්සේද එකල උසස්ම කුලයෙන් බිහි වූවෙක් නොවන බව කුලය කරපින්නා ගත්වුන් විසින් සැළකිල්ලට ගත යුත්තේය. බ්‍රාහ්මණ කුලය භාරතීය හින්දු

සමාජයේ උසස්ම කුලය වී තිබුණි. වර්තමානයේද තත්වය එසේමැයි. කුලයෙන් කෙනෙක් උසස් යැයි යන පිළිගැනීම බුදුරජහු හාස්‍යයට ලක් කළහ. කුලභේදය ථෙරවාදී සංඝ සමාජයේ හදවතට කා වැදී ඊට රදල ස්වරූපී භාවයක් දී ඇත්තේය. කරුණු මෙසේ හෙයින් ථෙරවාදී ආචාර්‍යවරුන්ට තම සම්ප්‍රදාය ගැන නැවත සළකා බැලීමට සිදුවී තිබේ. බුදුරදුන්ට කළ හැකි සමාජයීය අවනම්බුව ථෙරවාදීන් අතින් සිදු වී ඇති බැවිනි. බොහෝ විදේශිය උගතුන්ද විශේෂයෙන් යුරෝපීය විද්වතුන් ථෙරවාදයට කා වැදී ඇති මෙම අධර්මවාදී දුර්ගුණය පෙන්වා දී තිබේ.

ථෙරවාදී ඉගැන්වීම්වල ලොකුම දුර්වලතා දක්නට ඇත්තේ සසර හැකි තරම් සැප විඳ අන්තිමට නිවන් දැකීමේ පිළිවෙත තුළය. භුක්තානුමෝදනාවේ ථෙරවාදී ආචාර්‍ය පරම්පරාවේ උපයෝගි කරගන්නා පිං ලබාදෙන ක්‍රම පුන්‍ය කර්මයෝය. මෙහි අරමුණ පිං රැස් කිරීමයි. මෙම පුන්‍ය කර්ම බාල පන්නයේ ක්‍රියා බව බුදුරදුන් සළකා ඇත. ඊට හේතුව වන්නේ සැපසම්පත් ඇති ස්ථානවල පුනර්ජන්මය ලබාදී නිවන් දැකීම ප්‍රමාද කර ඊට බාධා කිරීමයි. දිව්‍ය බ්‍රහ්ම ආදී සම්පත් ඉතා දීර්ඝ කාලීන දේය. ඒවා භුක්ති විඳීමෙන් නිවන් දැකීම ප්‍රමාද වේ. එම නිසා පුන්‍යකර්මයක් අකුසල කර්මයක් යැයි සැළකිය හැකිය. කුසල හා අකුසල කර්ම කරන්නේ ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයට පිවිසි පුද්ගලයන්ය. පාප කාරී පුද්ගලයෙක් සතෙක් මරණ විට ඔහු කරන්නේ පාප කර්මයකි. එය අකුසල කර්මයක් නොවේ. ඔහුට ඉන් ලැබෙන්නේ පාපකර්මයන්ට අයත් වන විපාකයන්ය. යමෙක් දිව්‍ය සම්පත් පතා දන් දුනහොත් ඔහුට ඉන් පුන්‍යකර්මයක් සිදුවේ. කෙනෙකුට කුසල කර්ම රැස් කරගත නොහැක. මේ කර්මවලින් ඔහුට නිවන් ලබා ගැනීමේ හැකියාව පාදා දෙයි.[6]

## භික්ෂුව හා භාවනාව

ථෙරවාදය සසරදී ලැබෙන දෙව් මිනිස් සම්පත් සංකල්පය පිළිගෙන තිබේ. මෙම නිසා ථෙරවාදයේ ක්‍රියාත්මක වන භාවනා සම්ප්‍රදායක් නැත. භික්ෂූන් ප්‍රගුණත්වය ලබන්නේ වතාවත් පූජා



විධි බණ දේශනා, පිරිත් සජ්ඣායනා ආදියෙහිය. භාවනාව ථෙරවාදයට ඇතුල් වී ඇත්තේ මෑතකදීය. එයට දේශ සංචාරක ව්‍යාපාරය උපකාරී වී තිබේ. එම නිසා භාවනාව මෙහි කර්මාන්තයක් වී ඇත. එය මානසික හා හෘදය ආබාධ ආදියට පිළියමක් දෙන මනෝ වෛද්‍ය ක්‍රමයක් වී තිබේ. තවද එය විදේශ විනිමය ලබා දෙන ආදායම් මාර්ගයක්ද වී තිබේ.

භාවනාවද ථෙරවාදය සම්ප්‍රදායට අයත් අංගයකි. මෙයද චාරිත්‍ර ක්‍රමයක් නැතහොත් දිනපතා කළ යුතු ව්‍යායමයක් බවට පරිවර්තනය වී තිබේ. සෙන් මහායාන සම්ප්‍රදායේ මෙන් මෙහි භාවනා සම්ප්‍රදායක් ක්‍රියාත්මක නොවේ. සෙන් බෞද්ධයන්ගේ ජීවිතය භාවනාවට අනුබද්ධ වූවකි. භාවනාව සාර්ථකව ක්‍රියාත්මක වන්නේ ශීලයෙහි පිහිටා එය කිරීමෙනි. මේ ශීලය සම්මා දිට්ඨිය හා අනුබද්ධව තිබිය යුත්තකි. භාවනාව දෙපැත්ත කැපෙන කඩුවක් බඳුය. ඉන් සංසාර සම්බන්ධය කැපිය හැක. එසේම නිවනට ඇති සම්බන්ධතාවයද කපා දැමිය හැක. භාවනාව නිසා ආත්ම දෘෂ්ඨිය ප්‍රහීන කළ හැකිය. එසේම ආත්ම දෘෂ්ඨිය සියුම් ආකාරයකින් වර්ධනයද කළ හැකිය. එසේම සුවිශේෂ පිරිසකට අයත්වීමේ අදහස යෝගියාගේ සිත තුළ ඇති වේ නම් ඉන් ඔහුගේ ආත්ම දෘෂ්ඨිය වර්ධනය වේ. එයින්ද නිවන් මගින් ඈත් වේ. ඇතැම් භාවනා මධ්‍යස්ථාන සිර කඳවුරු බඳුය. එහි දී භාවනානුයෝගීන්ට සෝතාපන්න අනාගාමී ආදී සම්මාන පිරිනමනු ලැබේ. එහෙත් ථෙරවාදීන් කියන්නේ අරණ්‍යවාසී භික්ෂූන් අතින් භාවනා සම්ප්‍රදාය ගෙන එන බවය. අරන්‍යවල සිදුවන්නේ කුමක්ද යනු මහා ප්‍රහේලිකාවකි. සාන්තුවරයින් තෝරා ගැනීමේ දී ආගම්වල ගුහ්‍ය තීරණ ක්‍රම අනුව ඔවුන් තේරීම කරේ. මෙය අන්තරාදයක ක්‍රමයකි. එය රහසිගත ක්‍රමයක් නිසාම එය අනතුරුදායක වේ. මෙවැනි සම්ප්‍රදායන් තුළ අපරාධකරුවන්ද බොහෝ විට සුද්ධවන්තයින් විය හැකිය. අවසානවකට මෙන් අරහත් සංකල්පය ශුන්‍ය ක්‍රමයට විශුද්ධ තත්වයක් පිරිනමයි. එබැවින් මෙම කාර්‍යයෙහිලා අපට බෝධි සත්ව සංකල්ප අවශ්‍ය වන්නේය. බෞද්ධ හෝ අබෞද්ධ නියම භාවනා ක්‍රම දැන් ලක්දිව නැතැයි මෙයින් අදහස් නොකරයි. සියලුම සත්වයින් තුළ බුදුවීමේ එනම් සත්‍යාවබෝධයේ මූලබීජ නැත්නම් අන්තර්ලීන ශක්තිය

ඇත්තේය. එබැවින් ඔවුන් වඩන භාවනාවෙන් යම් කිසි ආධ්‍යාත්මික ප්‍රයෝජනයක් ඔවුන්ට ලැබේ. එබැවින් මෙහි සිටින සෑම කෙනෙක්ම පුන්‍ය කර්ම පමණක් කිරීමේ යෙදී ඇතැයි මෙයින් කියවෙන්නේ නැත. අරහත් පරමාර්ථය නිසා පුද්ගලයා හා සමාජය අතර තිබිය යුතු සම්බන්ධතා පිළිබඳ නවීන චින්තන තුළින් ඇතැම් ප්‍රශ්නද මතු වේ. පොදු සමාජයෙන් වෙන්ව තමාගේ පෞද්ගලික විමුක්තිය පමණක් සෙවීමට මහන්සි ගැනීම යහපත් ගුණයක්ද යන ප්‍රශ්නය මේ නිසා පැන නගී. ප්‍රතිත්‍ය ධර්මය නිසා වෙනම පුද්ගලයෙක් සිටි, ඔහු වෙනම ආත්ම ධාරියෙකි යනාදී සංකල්ප අත්හැරීමට සිදුවේ. සියළු දේ හි සියලු දෙනා අන්‍යෝන්‍ය ප්‍රතිබද්ධය එබැවින් මේ ලෝකයේ කිසිවකට හෝ කිසිවෙකුට හුදකලාව සිටිය නොහැකිය. මම මාගේ විශ්වයට සම්බන්ධ නැති පුද්ගලයකැයි සිතිය නොහැකිය. මගේ ශරීරය දෙස බලන කල්හි එය ආහාර නිසා පවතී. යන්න පැහැදිලි වේ. මෙයින් ගම්‍ය වන්නේ එය පැලැටි සත්වයින් ජලය අම්ලකර වායුව ආදියෙහි ආධාරයෙන් රදා පවතිනු බවය. මගේ ශාරීරික හා මානසික වර්ධනයද සමාජයේ අන්‍යයන් හා වෙන් කළ නොහැකි ආකාරවලින් බැඳී තිබේ. මෙම අන්‍යෝන්‍ය සම්බන්ධතාවය නිසා බෞද්ධයෙකුගේ පරාර්ථ චර්යාව අවශ්‍යයෙන්ම සිදුවිය යුත්තකි. මගේ පැවැත්ම ඇති වන්නේ විශ්වයේ අනික් කොටස් නිසාය. එම නිසා මම ද විශ්වයට හා එහි වාසීන්ට ණය ගැතිය. යුතුකම් ඉටුකළ යුතු කෙනෙක් වන්නෝය. තමා වෙනම පුද්ගලයෙක් නොව විශ්වයේ කොටසක්ම බව මිනිසා විසින් තේරුම් ගත යුතුය. බෞද්ධ ව්‍යවහාරයෙහි එන පෘතග්ජන (වෙන් වූ පුද්ගලයා) යන අදහස පැන නගින්නේද යන්න විමසා බැලිය යුතුය.

## අනාත්ම සංකල්පය

බොහෝ දෙනෙක් ආත්ම සංකල්පය ගුණධර්ම වර්ධනයට මහෝපකාරී වේ යැයි සිතති. එහෙත් ගුණදම් වගාවේ නියම පදනම වන්නේ අනාත්ම සංකල්පයයි. ගුණදම් වැඩිය යුත්තේ සිල් රැකිය යුත්තේ අනාත්ම ධර්මය නිසාමය. අප සියලු දෙනාම අන් සියලු දේ සමඟ බැඳි සිටිති. එබැවින් තමාගේ පමනක් විමුක්තිය



සෙවීම යහපත් ගුණධර්මයක් විය හැකිද? අරහත් සංකල්පය ථෙරවාදයේ මූලික ධර්මයකි. එබැවින් තමාගේ පමණක් විමුක්තිය සේවීම අනාත්ම ධර්මයට හානි කරවා අර්ථ ශූන්‍ය කරයි. ජාතක පොතෙහි නිධාන කතාවෙහි සුමේධ තාපසයෝ තම ආත්ම විමුක්තිය අත්හැර දමා සම්මා සම්බුද්ධත්වය පැතූහ. පුද්ගලික විමුක්තිය පමණක් සෙවීම පහත සඳහන් ආකාරයෙන් ප්‍රකාශ කර තිබේ.

> 'මේ කලුවර කාමරයක සිට අතිශයින් ප්‍රණීත වූ ආහාරයක්, කුසගින්නේ පීඩිතව සිටින අන්‍යයන් බලා සිටියදීම තනියම කිරීමක් වැන්න. තම දරුවන් ක්ෂුද්‍රා පිපාසයෙන් පීඩිතව සිටිද්දී මවක් තනියම අමෘත ආහාරය වැළඳීමක් වැන්න. ගිනිගත් ගෙයකින් තම දරුවන් දැවෙද්දී දෙමාපියන් සිය දිවි ගලවා ගෙන පැන දිවීමක් වැන්න. එබැවින් තනිවම රහසේ නිවන් දැකීම නිරර්ථකය'[7]

## බෝධිසත්ව සංකල්පය

බෝධිසත්ව සංකල්පයේ සියලු සත්වයන්ගේ සිත සුව පිණිස තම ජීවිතය පරිත්‍යාග කිරීම අගය කර තිබේ. එසේ නුවහොත් වර්තමානයෙහි ථෙරවාදයට සිදුවී ඇති අයුරින් සමාජය තමාට අදාළ නොවන දෙයකැයි අමතක කර දමයි. ආගමක් ගැන සැළකිල්ලක් නොදක්වන සමාජයක ඕනෑම දෙයක් සිදුවිය හැකිය. මක් නිසාද සෑම දෙයක් කිරීමට ඉන් අවසරය තිබෙන නිසාය.

රහතන් වහන්සේ ශ්‍රාවකයෙක් බුදුරජාණන් වහන්සේගේ අනුගාමිකයෙකි. කාලාම සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති මූලධර්ම සමග රහත් බෝධිය ගැළපෙන්නේ නැත. මෙහිදී මහායානිකයන් විසින් ථෙරවාදය හීනයානය යැයි නම් කිරීම යුක්ති සහගත බව කිව හැකිය. සියලු දෙනාටම බුදුවීමේ හැකියාව පිහිටා තිබෙන විට ශ්‍රාවකයෙක් වී බුදුවරයෙකු අනුගමනය කිරීම හීන වූ ක්‍රියා මාර්ගයකි.

හුවාන් පෝ නමැති චීන බෞද්ධාචාර්යවරයා විසින් ථෙරවාදය කෙරෙහි එල්ල කළ විවේචනයක් මෙහිදී අපේ සැළකිල්ලට යොමු වීම වටී. නිවන් දැකීම සීලය හා ප්‍රඥාව දියුණු

වීම නිසා සිදුවන්නකි. මේ ගුණ දෙක එකින් එකට උපකාර වෙයි. එක අතකින් අනිත් අත සෝදාගන්නාක් මෙනි. මේ උපමාව බුද්ධ භාෂිත එකකි. ශීලය ප්‍රඥාවෙන් වෙන්ව පුරුදු කිරීමෙන් අනික් අය සමග භාවමය සම්බන්ධතා පවත්වා ගැනීමට තුඩු දිය හැකිය. මක් නිසාද ලෝකය පිළිබඳ පරම සත්‍ය වන ශූන්‍යතාවය නොමැතිව ශීලය රැකීම නිසාය. ප්‍රඥාව ශීලයෙන් විනිර්මුක්ත ව වැඩීමෙන් මිනිසුන්ගෙන් වෙන් වී හුදකලාවීමට මහ පෑදිය හැක. හුවාං පෝ බෞද්ධ ආචාර්යවරයා ථෙරවාදීන් කරුණාවෙන් තොර ප්‍රඥාව වඩන්නේ යැයි චෝදනා කරයි. අරහත් පරමාර්ථය ඔහු විවේචනය කර ඇත්තේ මේ ආකාරයෙනි. ථෙරවාදීහු අනිමිත්තතාවය වර්ධනය කරති. එබැවින් ඔවුන් පුනර්ජන්මය ලබන්නේ අරූපි බ්‍රහ්ම ලෝකවලය. නිවන් සුවය ඔවුහු නොලබති. මෙයින් පෙනෙන්නේ ප්‍රඥාව සමතුලනය ලෙස දියුණු කරන්නේ නැත්නම් නිවනින් පිට වෙනත් අරමුණු කරා එළඹිය හැකි බවය.

## ත්‍රස්තවාදය

තවත් වැදගත් කරුණක් කෙරේ ථෙරවාදීන්ගේ අවධානය යොමු විය යුතුයි. එනම් දැනට මෙරට විද්‍යමාන හා ප්‍රචණ්ඩකාරී හිංසාවාදය ගැන සළකා බලන විට මේ ප්‍රශ්නය වඩාත් වැදගත් වේ. මේ රටවල මිණීමැරුම් සිදු වී ඇති ආකාරය දරුණුය ඉතා කෲරතරය. ඒවා සිතා මතා කලින් සැළසුම් කර සිදු වූ අපරාධයන්ය. හිංසාව, මිනීමැරුම් වැනි ප්‍රචණ්ඩකාරී අපරාධ මේ යුගයේ බොහෝ රටවල පැන නැගී ඇති සිදුවීම්ය. එහෙත් කරුණු දෙකක් නිසා ථෙරවාදීන් මේ කරුණෙහිලා විශේෂයෙන් සැළකිලිමත් විය යුතුයි. පළමු කරුණ නම් මේ මහා පරිමාන අපරාධ කලින් සිතාමතා සැළසුම් කළ ඒවා වීමය. දෙවන කරුණ නම් ථෙරවාදය අවිහිංසාවට ඇප කැප වූ දහමක් වීමයි. එම නිසා මේ සිදුවීම් වලට හේතු සොයා බැලීම වටනේය. මක් නිසාද ථෙරවාදී ඉගැන්වීම් සහ ධර්මප්‍රචාරක කටයුතු අසාර්ථක වී ඇති බව පෙනෙන හෙයිනි. ථෙරවාදි ධර්මයට මේ ප්‍රචණ්ඩ අපරාධවලට සම්බන්ධතාවයක් ඇද්ද, ආගම් ගරු නොකරන මිනිස් සංහතියද පරදුක්ඛ දුක්ඛිත නොවන ථෙරවාදී පිළිවෙතද මීට අදාළදැයි විමසා බැලිය යුතුය.



වර්තමානයෙහි ථෙරවාදයයි ක්‍රියාවේ යෙදෙන ධර්මය සමාජීය අංශයෙන් විමසා බැලීම වැදගත් කාරණයකි. වර්තමාන ථෙරවාදී පිළිවෙත වනාහි සංසාර පැවැත්ම ඉතා හොඳින් පවත්වාගෙන යෑමට උපකාරී වන ක්‍රියා පිළිවෙලකි. ඉන් කුලභේදය ස්ථාපිත කෙරේ. ඉන් කුලභේදය පිළිගැනීම පමණක් නොව ඊට ආගමික පිළිගැනීමක්ද පාරිශුද්ධ භාවයක්ද දී තිබේ. පූජා විධි ක්‍රම ථෙරවාදය තුළ ලොකු තැනක් ගන්නේය. දාන පිංකම් ක්‍රමය මතු ආත්මභාවයන්හි සැප පිණිස රක්ෂණ ක්‍රමයක් වී ඇත. බෝධි පූජා හා පිරිත් පිංකම් වැනි පූජා විධි හා චාරිත්‍ර සසර අප කරන වැඩ කටයුතුවලට ආරක්ෂාව සහතික කරයි. පිරිත් දේශනාව වැනි පිංකම් ආශ්චර්යමත් භූත විද්‍යාත්මක මන්තර වශයෙන් ලෞකික සැපසම්පත් සඳහා උපයෝගී කරගනු ලැබේ. ථෙරවාද බුදුසමය පිං රැස් කරගැනීම තුළින් දිව්‍යමනුෂ්‍ය සැපසම්පත් විඳිමින් හැකිතාක් කල් සසර දික්කර ගැනීමට උපයෝගී කරගනී. ඉන් නිර්වාණයට වචනවලට සීමා වූ ගෞරවයක් පිරිනමනු ලැබේ. නිවන් පසක් කර දීම මෙතේ බුදුන්ට පවරා තිබේ. මේ නිසා ථෙරවාදය භක්ති මාර්ගයක් බවට පරිවර්තනය වී තිබේ.

## වර්තමාන ප්‍රශ්න

වර්තමානය වැනි අර්බුදකාරී යුගයක ථෙරවාදීන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ඉක්මණින් විසඳා ගත යුතු ප්‍රශ්න කීපයක් ඇත. එකක් නම් යුද්ධය නිසා අනාථ වූ ජනයා පිළිබඳ ප්‍රශ්නයයි. බෞද්ධයින් වශයෙන් අපි බලවත් පරිශ්‍රමයක් ගෙන මේ අනාථයින්ට පිහිටවීමට ආයතන සම්පාදනය කරදී ඇද්ද යන වග සළකා බැලිය යුතුය. අප කළ දේ ප්‍රමාණවත්ද? නො එසේ නම් කිසියම් දෙයක් කළාද? අපේ ක්‍රියා කලාපය අප විසින් සංසන්දනය කර බැලිය යුත්තේ කල්කටා නුවර දුගී මුඩුක්කු වාසීන්ට කතෝලික තෙරේසා මව් තුමියගේ වැඩ පිළිවෙලත් සමගය. අපි දානය හා කරුණා ගුණය ගැන ලොකුවට කතා කරන්නෙමු. ථෙරවාදීන්ට තෙරේසා මව්තුමිය වැනි පරාර්ථචර්යාවට ඇප කැප වූ කෙනෙක් බිහි කිරීමට පුළුවන් වී තිබේද? ථෙරවාදය සමත් වී ඇත්තේ දේපල දාන ආදී

පරිත්‍යාග ලබා ගැනීමට සමත් වූ භික්ෂු පරපුරක් බිහි කිරීමටය. ඔවුන්ට ආත්ම පරිත්‍යාගයෙන් මහජන සේවය කිරීම කුමක්දැයි කියා හෝ වැටහීමක් පවා නැත. එබැවින් එවැනි ක්‍රියාදාමයන් ථෙරවාදයේ නැතිවීම ප්‍රශ්නයක් වී තිබේ. අපේ අහ හිග ඇති ජනයාට උදව් පදව් කිරීමට ක්‍රිස්තියානි මිෂනාරීන් පැමිණි විට අප නැගී සිට ඔවුන් විවේචනය කරමු. එහෙත් මේ දුගී ජනයා ඇති කර ඇත්තේ අපමය. මක් නිසාද සමාජ සේවය අතින් අපේ ඇති දුර්වලතාවය නිසාය. අපි ඔවුන් විවේචනය කරන විට මේ ඔවුන් තම ආගම පිළිපදින ආකාරය යැයි අමතක කළ යුතු නැත. කිතුනු දහම් ප්‍රචාරකයන් ශක්තිය ලබන්නේ මෙවැනි සේවාවලිනි. බෞද්ධයින් මේ බව වටහා ගන්නේ නැත. අපි ඔවුන්ගෙන් උතුම් පාඩමක් ඉගෙන ගන්නේ නැත. අපේ වරද සහවා ගෙන අප කියන්නේ වරද කරන්නේ අප නොව ඔවුන්ය කියාය.

මෙයට සම්බන්ධ තවත් කරුණක් නම් පන්සල් ආදියට ලැබෙන මහජන මුදල් හා දේපල පරිත්‍යාගයන්ය. මේ දේපල සංඝයාට ලැබෙන්නේ ආගමික හෝ පුන්‍යමය කටයුතු කිරීම සඳහාය. නමුත් ථෙරවාදී සංඝයා එම පරිත්‍යාග පාවිච්චි කරන්නේ පෘතග්ජන මිනිසුන් තම දේපල පාවිච්චි කරන ආකාරයෙන්මය. එනම් ලෞකික වැඩට හා අලංකාරය පිණිසය. විහාරාරාමවලට උපභෝග සම්පත් ලබාගැනීමටය. මේ මුදල් සම්භාරය දස ලක්ෂ ගණනින් බැංකුවල තැන්පත් කර තිබේ. නැත්නම් වෙනත් ආයෝජනවල යොදවා තිබේ. එහෙත් බෞද්ධ දයාව හා කරුණාව මේ සම්පත් සමාජ සේවය පිණිස කැප කිරීමට නොයොදවයි. භාණ්ඩාගාරයේ ශ්‍රීපාද අර මුදලේ රුපියල් කෝටි 300 කට වැඩි ගණනක් තිබෙන බව පුවත් පත් වාර්තාවක පලවීය. එක වන්දනා සමයක ශ්‍රී පාදයට රුපියල් දස ලක්ෂ 5 ක් පමණ ලැබේ. මෙපමණ මුදල් තිබියදීත් වන්දනාකරුවන්ට මූලික වැසිකිලි පහසුවවත් ශ්‍රීපාද භාරකරුවන් ලබාදෙන්නේ නැත. (දිවයින 12.05.1990 - 14 වන පිටුව.) මේ මුදල් ලැබෙන්නේ වන්දනාකරුවන්ගෙනි. එබැවින් ඔවුන්ගේ පහසුවටවත් මේ මුදල් වියදම් කරන්නේ නැත. මේවා මහජන මුදල්ය. මහජනයාට ඒවා ගැන කතා කිරීමේ අයිතියක් ඇත. බෞද්ධයින්ගේ



ආගමික හැඟීම් නිසා මේ මුදල් ලැබේ. එම බෞද්ධ ධර්මයේ උගන්වන අර්ථචර්‍යාව සමාජ සේවය මගින් ඉටු කිරීමට මේ මුදල් යෙදවිය යුතුය. අවශ්‍ය වී ඇත්තේ බෞද්ධ ගුණධර්මවලට ඇප කැප වී ක්‍රියා කිරීමය.

**සංඝ සමාජය**

ථෙරවාදයේ ආරක්ෂකයෝ සංඝ සමාජයේ මහ ථෙරවරුය. මේ සමාජයේද බලවත් ප්‍රශ්න තිබේ. සංඝ සමාජයද තම වටපිටාව වන ගිහි සමාජයේ ආකල්ප හා චින්තනය අනුව හැඩ ගැසේ යැයි කෙනෙකුට කිව හැක. නමුත් සංඝයා නොකිරීමට ප්‍රවේසම් විය යුත්තේද මෙයයි. සංඝ සමාජය ආගමික සමාජයකි. ගිහි සමාජයේ ඇති නරක දැක දැක ඒවා මහ හරවා ගැනීමට ගිහියන්ට අවවාද අනුශාසනා කිරීම සංඝයාගේ යුතුකමය. මහජනයාට ධර්මය හා එමගින් උගන්වන සාධාරණය කියා දී ඔවුන් හැඩ ගැස් විය යුත්තේ සංඝයාය. සංඝ සමාජය ගිහි සමාජයෙන් හටගත් එකක් නමුත් මඩේ හටගත් පියුමක් ලෙස එය සැලකිය යුතුය. ගිහි සමාජයේ දුෂ්චරිත හා වැරදි ආකල්පවලින් සංඝයා මිදී දුසිරිත්වලින් සංඝ සමාජය ඈත් වියුයත්තේය. තම වට පිටාව අනුව හැඩගැසී සිටීමට සිදුහත් කුමරු සුදානම්ව සිටියේ නම් අද බුදු දහම කියා දෙයක් ලොව තිබිය හැකිද? අධ්‍යාත්මික ගුණ වගාව පිණිස පිහිටි සංඝ සමාජය ගිහි සමාජයේ දුශ්චරිත වැළඳ ගන්නේ නම් සංඝ සමාජය ආගමික සමාජයක් නොවන්නේය. මේ මගින් වන ගුණධර්ම පරිහානිය නිසා සංඝයාට ඇති ගෞරවය හා සැළකිල්ල නැති වී යන්නේය. සංඝයාට බලතල ලැබෙන්නේ ඔවුන් තුළ ඇති ධාර්මික ගුණධර්ම තුළිනි. සංඝ සමාජය මෙකල ගිහිකම්වලට නැඹුරු වීගෙන යයි. එමගින් සංඝයා ගිහියන් අනුගමනය කිරීමට සුදානම් බවක් පෙනෙයි. බුද්ධ ධර්මය හැදෑරීම නොව ගිහියන්ගේ රැකී රක්ෂාවලට උවමනා කරන විෂයවලට භික්ෂූන් වහන්සේ ඇදී යන්නාහ. ඇතැම් පිරිවෙන්වල පිරිමි ළමයින් මහණ කරන්නේ රජයෙන් ලැබෙන ආධාර මුදල් ප්‍රමාණය වැඩි කරගැනීම පිණිසය. වර්තමාන සංඝ සමාජයේ ඉතාමත් සිත් කම්පා කරවන

ලක්ෂණයක් නම් ආගමික අධ්‍යාපනයක් නොලත් පාළි භාෂාව පිළිබඳ දැනුමක් නැති බණ පිරිත් කීමට හැකියාව නැති වතාවතක්ද නොදන්නා ආගමික චාරිත්‍ර අනුව බුද්ධ පූජා ආදිය පැවැත්වීමටද නොදන්නා අළුත් හිමිවරු පරපුරක් බිහි වී සිටීමය. මේවා අනාගත පරිහානියේ පෙරනිමිතිය. මේ ප්‍රවනතාවය වර්ධනය වුවහොත් ථෙරවාදී සංඝ පරපුරේ අභාවය මින් සිදුවන්නේය.

මනුෂ්‍ය ඉතිහාසය සළකා බලන විට මෙවැනි ගුණධර්ම පරිහානි යුගයන් විටින් විට ඇති වන බව පෙනේ. මෙවැනි යුගවලදී ඉන් මිදීමට ඇති එකම ක්‍රමය ගුණධර්මවල පිහිටීමය. වර්තමාන තත්වය අනුව බෞද්ධ සමාජ සේවා ආයතන සම්පූර්ණයෙන් දුබල වී තිබේ. ආයතනයෝ සමාජයක බලය රදන මධ්‍යස්ථාන වෙති. මෙම ආයතන ගුණධර්මවලින් පිරිහුන කල්හි සමාජය අසරණ වෙයි. දුබලද වෙයි. මේ බව වර්තමාන බෞද්ධ සමාජය තුළින් හොඳ හැටි දැනගත හැක.

### භික්ෂු දේශපාලනය

තවත් ගැටළුවක් නම් ථෙරවාදී සංඝ සමාජය දේශපාලනයට නැඹුරු වීමය. වර්තමාන සමාජ අර්බුදවලට ථෙරවාද බෞද්ධ ආයතන කිසිම විසඳුමක් ඉදිරිපත් කරන්නේ නැත. බුදු දහම සිංහල දහමක් නොවේ. බුදුරදුන්ගේ පණිවිඩය සියලු සත්වයන්ටය. ඊට දෙමළ ජනයාද ත්‍රස්තවාදීන්ද අයත්ය. මිනිසුන් තවත් මිනිසුන් කොටසක් විසින් මරා දමන විට බෞද්ධයන් එකතු වී මීට හේතුව පරීක්ෂාකාරීව සොයා මේ ව්‍යසනය හටගන්නේ මොකක් පවතින නිසාදැයි විමසිය යුතුය. බෞද්ධයන් පරිත්‍යාග ශිලීව ඇප කැප වී මීට විසඳුමක් සෙවිය යුතුයි. බෞද්ධයින් වූ අප සිංහලයින් පමණක් ගැන සිතාමතා කටයුතු කරන්නේනම්, නැතහොත් යම්කිසි කුලයක් වැනි කණ්ඩායමක් ගැන පමණක් සිතා කරතහොත් එම නිසා අනුන් කෙරෙහි ද්වේෂය හා අමනාපය ඇති වන්නේය. බෞද්ධයින් වශයෙන් අප සැළකිය යුතු කරුණක් ඇත. එනම් අප බොහෝ කල් නොයෙක් ජාතිවල ඉපිද සසර සැරි සරා ඇති බවය. වර්තමානයේ අපි සිංහල බෞද්ධයන් ලෙස ඉපිද ලංකාවේ වාසය කරමු. අප මේ ජාතියේ අප මේ කුලයට අයත්



අන්‍යයන්ට වඩා උසස් පුද්ගලයින් යැයි ශ්‍රී ලංකාවේ අප සිටින සුළු කාලයේ දී කල්පනා කරන්නේ නම් එයින් ක්‍රෝධය හා විරෝධතා ආදී අකුසල චේතනා සම්භාරයක් අප තුළ ජනිත වනවා ඇත. එය අපේ සසර ඉදිරි පැවැත්මට අන්තරාදායකය. කරදරයට, විපතට හා අසහනයට පත් මිනිසුන්ට අප මේ ජීවිතය හැර යන්නට පෙර අපට කළ හැකි හැම උපකාරයක්ම කළ යුතුය. අපි හෝටලයක ලැගුම් ගන්නේ දින කීපයකට පමණ නම් එහි සිටින්නන් දෙපිරිසක් අතර ඇති වන කොටා ගැනීම්වලට සහභාගිවීමෙන් අපට ඇති ප්‍රයෝජනය කුමක්ද? මේ සටනට සහභාගි වී වටිනා කාලය නාස්ති කළහොත් අපට ආපසු යන්ට තිබෙන නැව හෝ අහස් යානයටද නියමිත වේලාවට යෑමට නොහැකි වනවා ඇත. එම නිසා අපේ දේශ සංචාරය පිළිබඳ වැඩ සටහනද කඩා කප්පල් වෙනවා ඇත. අපේ දීර්ඝ කාලීන සෙත හා සතුට අපට ලැබෙන්නේ මෛත්‍රීය වැඩීමෙන් මිස ද්වේශය වැඩීමෙන් නොවේ. මේ මෛත්‍රී ධර්මයම අපේ වර්තමාන ජාතිභේද අර්බුදය විසඳීමට මහෝපකාරී වනවා ඇත.

### නිකායාන්තර මතභේද

ථෙරවාදයේ දක්නට ලැබෙන සෝචනීය තත්වයක් තිබේ. එනම් බුද්ධ කාලයෙන් පසුව ශාසනයේ ඇති වූ නිකායාන්තර වර්ධනය පිළිබඳ අර්ථය හා වටිනාකම තේරුම් ගැනීමට ථෙරවාදීන්ට නොහැකිවීමය. මහායානය හා තන්ත්‍රය ගැන හරි අවබෝධයක් හා ඇගයුමක් ථෙරවාදීන්ට නැත. ථෙරවාදීන්ගේ පටු කල්පනාව අනුව මහායානය ක්‍රිස්තියානි තරම්වත් නොවටනේය. වර්තමාන ථෙරවාද - මහායාන ආරවුල මිළ මුදල් ලබාගැනීම පිණිස කරන ලද අරගලයෙකි. එබැවින් ඊට යෙන් යානය නමැති විහිළු නමක්ද පටබැඳ තිබේ. මෙහි ථෙරවාදී ඇදුරන් ගරු කළේ මහායාන ඉගැන්වීම්වලට නොව යෙන් හෙවත් ජපන් මුදල්වලටය. ඔවුන්ට උවමනා කළේ මහායානය නොව මහා යෙන් පිළිවෙතය.[8]

ලක්දිව ඉතිහාසයෙහි මහායාන ඉගැන්වීම් ප්‍රබල ආගමික හා සමාජීය බල වේගයක්ව අනුරාධපුර යුගයෙහි තිබුණි. ක්‍රිඃ වර්ෂයෙනේ 5 වන හා 11 වන සියවස අතර ලක්දිව ප්‍රමබ ආගමික බලය තිබුණේ ථෙරවාදයට නොව මහායානයට බව අප මතක තබා ගත යුතුය. මින් පසුවද මහායානය ජනප්‍රියව තිබු

බවට පුරා විද්‍යාත්මක සාක්ෂි තිබේ. ඇතැම් යුගවල මහායානයේ ඉහළම පෙළේ බෝධිසත්වරයෙකු වන අවලෝකිතේශ්වරයන්ට නාථ දෙවියන් නමින් පුද පූජා කරන ලදි. ලක්දිව දක්නට ලැබෙන මාලිගාවිල ප්‍රතිමාව ලෝකයේ උසම බෝධිසත්ව පිළිමය බව විද්වත්හු සළකති. මේ ප්‍රතිමාව අවලෝකිතේශ්වර බෝධිසත්ව රූපයකි. මහනුවර යුගයේදී සිංහල රජතුමාට හිස තෙල් ගා රාජ්‍ය භාර දෙන් ලද්දේ ද මහනුවර නාථ දේවාලයේය. මෙය පිහිටා තිබෙන්නේ බෞද්ධ විහාර භූමියක් තුළය. ලක්දිව වෙනත් පළාත්වලද නාථ දේවාල පිහිටා ඇත්තේ බෞද්ධ විහාර තුළමය.

බෞද්ධයින්ගේ පූජා හා ඇදහිලි සම්ප්‍රදාය විශේෂයේම ගැමි බොදුනු වන්නේ ඇදහිලි තුළ බෝධිසත්ව සංකල්පය ගැඹුරට කිදා බැස තිබේ. බෞද්ධ ගැමියන්ගේ ආගමික චින්තනය සකස් වී ඇත්තේ ථෙරවාද දූරවබෝධ සූත්‍ර මත නොව බෝධිසත්ව සංකල්පය හා ජාතක කථා ඇසුරිනි. ජාතක පොත ඔවුන්ගේ සදාතන ගුරුවරයාය. මේ ගැමි ජන සම්ප්‍රදාය මහායාන බෝධිසත්ව සංකල්පය ඉහළින් පිළිගෙන ඇත.

බෝධිසත්ව සංකල්පය සංකීර්ණවූද බල සම්පන්න වූද එකකි. එය තුළ ප්‍රඥාව හා කරුණාව සම්බන්ධ කර ඇත්තේ සියල්ලන් තුළ බුද්ධි සම්පන්න චින්තන හා චර්‍යා ක්‍රමයක් ඇතිවන අයුරුනි. ඇත්ත වශයෙන් වැදගත් දෙය වන්නේ මිනිසා දරණ ආකල්පයෝය. ජාතක පොත් වහන්සේට අයත් පසුබිම දක්වන බුද්ධවංසය අනුව දීපංකර බුදුරජහු සුමේධ තවුසා සුවඳ මලින් පිදූහ. මෙයින් ජාතක පොත බෝධිසත්වයන් කොපමණ ඉහළින් පිළිගෙන ගරුකර ඇද්දැයි අපට පෙනී යා යුතුය.

ථෙරවාදී ආචාර්‍ය පරම්පරාව මේ ගැමි බෞද්ධයින්ගේ පිළිවෙතට වෙනස් පිළිවෙතක් අනුගමනය කරයි. මුල් බුදු දහමේ ඉගැන්වීම් ආශ්‍රය කරගෙන තම ආචාර්‍ය පරම්පරාව සකස් කරගත් ඉගැන්වීම් සමූහයක් ථෙරවාදීහු පිළිගෙන අනුගමනය කරති.



## අනුරපුර යුගයේ මහායානය

මහායාන ධර්මය වසර දහසකට වැඩි කාලයක් අනුරපුර යුගයේ බලයට පත්ව සිටියේය. මේ නිසා බෞද්ධ මහ ජනයා තුළ එහි ඉගැන්වීම්වල ආභාසය තදින් කා වැදී ගියේය. සිංහල බෞද්ධයින් මිය ගිය පසු සත්වන දිනයේ ඔහු වෙනුවෙන් පිංකම් කොට පින් පමුණුවයි. මේ ක්‍රියාව සියලු බෞද්ධයෝ දැන් ඒකමතිකව පිළිගෙන ක්‍රියා කරති. මේ ක්‍රියාව ථෙරවාදය අනුව පහදා දිය හැකි නැත. මෙය මහායාන ආභාසය නිසා සිදුවූවකි. ටිබට් බෞද්ධයින්ගේ මළවුන්ගේ බණ පොතේ මේ ප්‍රාප්තිදානය සිදු කිරීමේ අවශ්‍යතාවය හා ඊට හේතු වන අන්තරාභව සංකල්පය විස්තර කර දී තිබේ. පිරිත් පිංකම් අවසානයේදී අතේ පිරිත් නූලක් බැඳ ආරක්ෂාවද අපෙක්ෂා කිරීමද භ්‍රාන්තික පිළිවෙතකි. එයට ථෙරවාදී අර්ථකථනයද සකස් කරගෙන තිබේ. මේ බාහිර වත් පිළිවෙත්වලට පරමාර්ථ අර්ථකථනය දෙන කල්හි ඒවා තන්ත්‍ර ස්වරූපී වන්නේය. බුදු දහම ගෘහස්ථ ස්වරූපී කිරීම හා දේශපාලනමය මුහුණුවරක් දීම නිසාද මෙය සිදු වී ඇත.

බුද්ධ ධර්මය නැතහොත් මනුෂ්‍ය චින්තනය එහි උපරිම අවස්ථාව ගෞතම බුදුරදුන්ගෙන් අවසන් වූයේ යැයි සිතීම කාලාම සූත්‍ර දේශනාවේ උගන්වන චින්තන සම්ප්‍රදායට පටහැනිය. උදාහරණයක් වශයෙන් දක්වතොත් නාගර්ජුන ආචාර්‍ය පාදයන්ගේ ඉගැන්වීම 'බුදු දහමේ කේන්ද්‍රීය දර්ශනය' ලෙස හඳුන්වා දෙනු ලැබේ. බෞද්ධ ලෝකයේ වැඩි දෙනෙක් එතුමා දෙවැනි බුදුරවරයෙක් ලෙස සළකති. එතුමාගේ ඉගැන්වීම වූකලී නිවන් දැකීම ඥාන මාර්ගීය විප්ලවයක් බවය. නිර්වානය හා සංසාරය අතර වෙනසක් නැත එතුමාගේ නිගමනයකි. ඉන් පසුව තන්ත්‍ර යාතිකයෝ පැමිණ සසර නිවන යැයි දැක්විය හැකි බව ප්‍රකාශ කළහ. මෙලොව සිටින විට එහි ඇති නිවන් සැපය වන පංචකාමය භුක්ති වින්ද යුතුය. එය සම්පූර්ණයෙන් අත්හල යුතු නැත යනු ඔවුන්ගේ ඉගැන්වීම විය.



UNIVERSITY 2000 LIBRARY

තන්ත්‍රවාදීහු, ථෙරවාදීන් මෙලොවින් බේරී පැනයෑමට යත්න දරන්නේ යැයි චෝදනා කළහ. මෙහිදී අප විසින් සළකා බැලිය යුතු කරුණක් තිබේ. ථෙරවාදී ස්ථාවරය මූලික පියරවක් වශයෙන් හොඳ යැයි තාන්ත්‍රිකයෝ පිළිගනිති. එහෙත් ඉන් ඉහළට එයද අභිබවා අප යා යුතු බව ඔවුහු කියති. ථෙරවාදීන්ගේ දුර්වලකම නම් ඔවුන් මේ දෘෂ්ඨිකෝණය සළකා බැලීමටවත් අකමැතිවීමය. ඒවා අධ්‍යයනය කර පරතෙරට දැනගැනීම ගැන කියනුම කවරේද? ථෙරවාදය ලෝකයට පිටුපා එය අත්හැර දැමීමේ ප්‍රතිපත්තිය පිළිගනී. බටහිර ලෝකයද ථෙරවාදීමය ආකල්පය ලොකු ප්‍රශ්නයක් ලෙස සළකයි. ථෙරවාදී ධර්මය දුක අවධානය කරයි. ථෙරවාදී සම්ප්‍රදාය දුක් විඳීමට ශ්‍රද්ධාභාවයක් දීමට අන් මගකින් උවමනාවක් දරා ඇත.

## මහායානයේ දුර්වලතා

තවද මහායානය තුළද ප්‍රශ්න හා ගැටළු ඇත්තේය. විශේෂයෙන් ප්‍රතිපත්ති ධර්මවල මෙය දක්නට ලැබේ. ථෙරවාදය මෙන්ම මහායානයද අන්‍ය වෙනත් ආගමක්ද චින්තන විප්ලවයක් නොමැතිව ඉදිරියට ගලා නොයමින් එක තැන පල්වුවහොත් එහි මූලධර්මවලට පටහැනි වූ බාහිර ඉගැන්වීම් ක්‍රමයක් බවට පරිවර්තනය විය හැකිය. ථෙරවාද දෘෂ්ඨි කෝණයෙන් බැලූ කල මහායානයේ ප්‍රධාන දුර්වලකම එහි ආචාර්‍යවරුන්ට දෙන විශාල ප්‍රමුඛත්වය හා ස්ථානයත්ය. එසේම එහි ඇති භක්තිමය ස්වරූපයද එහි ඇති දුර්වලකමක්ය. භක්තිමය මහායානයේ උපාය කෞශල්‍ය පිළිවෙතක් යැයි කියනු ලැබේ. එහෙත් ප්‍රායෝගික වශයෙන් සැළකූ කල එය අන්ධභක්තියක ස්වරූපය ගෙන තිබේ. බෞද්ධ තන්ත්‍ර යානය ගුප්ත විද්‍යා ක්‍රමයක් බවද විකෘති ක්‍රියාදාමයකට මඟ පාදා ඇති ඉගැන්වීමක් යැයිද බොහෝ විට සළකනු ලැබේ.

අපක්ෂපාතීව අගතියෙන් තොරව ථෙරවාදය දෙස කෙනෙකුට බැලිය හැකි නම් පුදුමයකට මෙන් ථෙරවාදයද මහායානයේ ශාඛා ප්‍රශාඛාවන් බව පෙනී යා යුතුය. මක් නිසාද ථෙරවාදී



සම්ප්‍රදාය විශ්වාසය තබා ඇත්තේ භක්තියෙන් විමුක්තිය ලබා ගැනීම හා පුද පූජා ක්‍රම මත බැවිනි. මෛත්‍රී බුදුන් කෙරෙහි විශ්වාසය එහි කේන්ද්‍රීය ඇදහිල්ලකි.

එබැවින් ථෙරවාදී මහායාන හා තන්ත්‍රයානය මුල් බුද්ධ දේශනාව දෙස තම අවධානය යොමු කර තම තමනගේ තත්වය විචාරාත්මකව නැවත සළකා බැලිය යුතුය. ඉන් පසු මුල් බුදු දහම අනුව තම ඉගැන්වීම් හා ප්‍රතිපත්ති සකස් කර ගත යුතුය. ප්‍රධානතම කරුණ විය යුත්තේ මේ බෞද්ධ සම්ප්‍රදායන් ගැන එකින් එක හා සන්සන්දනය කර විචාරාක්ෂියෙන් සළකා බැලීමය. ථෙරවාදයේ ඇති භක්ති - විරෝධී තදින් දුෂ්ඨිගත ඒකාධිකාරී චින්තනය පිටු දකින නිදහස් පිළිවෙතින් ආදර්ශය හා ආභාසය ලැබීම මහායානයට හිතකර වේ. ථෙරවාදයේ ඇති අක්‍රියාශිලී අලස පිළිවෙතට මහායානයෙන් හොඳ ආභාසයක් ලබා තම අඩුපාඩු කම් මග හරවා ගත හැකිය.

## තාන්ත්‍රික මත

ථෙරවාදීහු තෘෂ්ණාව යටපත් කර දැමීම මුවාවෙන් සියළු යහපත් හැඟීම්, (කරුණා මෛත්‍රිය ආදිය) අකා මකා දමා සිත් පිත් නැති දරදඬු දැව කඳන් වීමට උත්සුක වෙති. ලිංගේන්ද්‍රය කපා දමන ලද පුද්ගලයා ශුද්ධවන්තයා ලෙස සළකනු ලැබේ. මෙම නිසා ථෙරවාදී බුදු දහම තාපසයන්ගේ ආගමක් වීමේ ප්‍රවනතාවයක් ගෙන තිබේ. ථෙරවාදීන්ගේ අරමුණ වී ඇත්තේ සසරින් මිදීම සඳහා වනගත ආරන්‍යවලට වැද හුදකලාව භාවනා වඩමින් ගල්ගුහා තුළ සිට නිවන් මඟ පාදා ගැනීමය. තන්ත්‍ර යානකයින් කියන්නේ පරමාර්ථ වශයෙන් ද්විත්ව ස්වභාවය නැති බවය. ඇත්තේ එකම එක ස්වභාවයකි. එම නිසා දුකින් මිදීම පිණිස ථෙරවාදීන් දරන ප්‍රයත්නය සාරවත් දෙයක් නොවේ. සංසාර සංකල්පය මනඃ කල්පිතයකි, මායාවකි. අපේම මනඃකල්පිතයන්ට අප බිය නොවිය යුතුය. එහෙත් ථෙරවාදී හු සංසාර භීරුකයෝය. ඔවුන් ඉන් පලා යෑමට තැත් කරන්නෝය. ඔවුන් වල් වැදී ගුහාවලට වැදුන විට පංචේන්ද්‍රියන් පොළඹවන අරමුණුවලින් ඈත් බැවින් ඉන්ද්‍රිය දමනය පහසු වන්නේය. අපට

අවශ්‍ය වී ඇත්තේ සංසාර මායාවෙන් සිත මුදාගැනීමය. අපි මේ මායාව නමැති හීන ලෝකයෙන් අවදි වූ විට අපට නිර්වාණය අවබෝධ වේ. එය මේ ලෝකයේම ඇති දෙයකි.

ලාමා යෙගේ මෙසේ කියා තිබේ

'බොහෝ අය තම මිනිස් ස්වභාවය අතහැර දමා නිවන් පිණිස ප්‍රතිපත්ති පිරිය යුතු යැයි කියති. ඔවුන් සැප කෙරෙහි මහත් සේ සැක පහළ කරගෙන තිබේ. දුක්බරව සිටීම හොඳ යහපත් දෙයක් යැයි එම නිසා සිතීමටද හුරු පුරුදු වී සිටිති. මම ධර්මචාරියෙක්මි. එබැවින් මා පසිඳුරන් පිනවිය නොයුතුය. ඔවුහු සදාකාලික සුවය හා සෙත බලාපොරොත්තු වෙති. එහෙත් එදිනෙදා ජීවිතයේ සුව පහසුකම් ඔවුහු පිටු දකිති.'

'බොහෝ අය සිතන ක්‍රමය වැරදිය. පසිඳුරන් පිනවීමේ ඇති වරදක් නැත. වරද ඇත්තේ අප මේ අල්ලා ගන්නා ආකාරයේය. මේවා සැප ලැබෙන ක්‍රම නොව දුක් දෙන හේතු සාධක බවට පරිවර්තනය කර ගැනීමය. එසේ අධානග්‍රාහය තුළය වරද ඇත්තේ සැපවල නොවේය.'

සැප ආකල්පයට තවත් පැත්තක් තිබෙන බව හේ කියයි. 'බෞද්ධ සූත්‍ර දේශනා අනුව පංචකාම තෘෂ්ණාව, ඊර්ශ්‍යා ගතිය ආදි නොයෙක් ආත්මාර්ථකාමී ගති අප සිත කිලිටි කරන විෂ ද්‍රව්‍යයක් බව සැළකිය යුතුය. මේවාවල ආදීනව කියා මේ චිත්ත ක්ලේශයන් දුරු කළ යුතු බව කියා තිබේ. එහෙත් තාන්ත්‍රික දෘෂ්ඨි කෝණය වෙනස් එකකි. එහිද තෘෂ්ණාවෙන් බැඳී සිටීම දුකට හේතුවක් බව පිළිගනී. එහෙත් මේ විපරීත දෘෂ්ඨිය උපාය මාර්ගයකින් සත්‍යාවබෝධ කරන මගට හැරවීම එහි උගන්වා තිබේ.

දක්ෂ වෛද්‍යවරුන්ට විෂ පැළැටි ගෙන ලෙඩ සුව කරන බලවත් ඖෂධ නිෂ්පාදනය කළ හැකිය. එසේම දක්ෂ තාන්ත්‍රික යෝගී තෙමේ තෘෂ්ණාව මගින් ජනිත වන චිත්ත වේගය තමාගේ විමුක්තිය පිණිස හරවා ගනී. මෙය නියත වශයෙන්ම කිරීමට හැකි දෙයකි.'[10]



ථෙරවාදය වනාහි බුදුරදුන්ගේ මුල් ඉගැන්වීමැයි බොහෝ දෙනා දරන දුර්මතයකි. බුදු දහමේ ආරම්භය හා විකාශනය පිළිබඳ ඉතිහාසය පර්යේෂණයට භාජනය වී තිබේ. එම නිසා ඉහත සඳහන් මතය මෙම පරියේෂණවල ප්‍රතිඵල හා සසඳා බැලිය යුත්තේය. ඉහත සඳහන් දුර්මතය ථෙරවාදීන් විසින්ම ගොතාගෙන ප්‍රචාරය කළ අදහසක් බව වැදගත් ඉතිහාසඥයින් පිළිගෙන තිබේ. මහායානිකයින් ප්‍රචාරය කළ මතය නම් බුදුරදුන් හීන යානය මහායානය හා තන්ත්‍රය යන තුන් වැදෑරුම් ඉගැන්වීම් ක්‍රම නා නා පුද්ගලයින්ගේ චරිතවලට අනුරූප වන පරිදි දේශනා කර ඇති බවය. ඇතැමෙකුගේ මතය වූකලි මහායානය බුද්ධ දේශිත මුල් බුදු දහමට වඩා කිට්ටු බවය. ලාල්මණී ජෝසි පඬිවරයා මෙසේ ප්‍රකාශ කර තිබේ.

'බොහෝ බෞද්ධ පඬිවරු මහායාන සූත්‍ර නොයෙක් අංශවලින් බුදුරදුන්ගේ මුල් ඉගැන්වීම්වලට වඩා සමීප බව පිළිගෙන තිබේ. එම නිසා ඉංග්‍රිසි ජාතික සංඝ රක්ෂිත භික්ෂුන් වහන්සේ මෙසේ ලියා තිබේ. 'මහායානයට අයත් ආචාර්යවාද සමස්තයක් වශයෙන් ගත් විට බුදුරදුන්ගේ මුල් ඉගැන්වීම්වලට අනුකූලය. මහායානය බිහි වී ඇත්තේ මුල් බුද්ධ වචන ආශ්‍රයෙන්ය. මහායානයේ වෙනස් නොකරන අනිවාර්ය මති මතාන්තර හැරුන විට ඒවා තුළ ඇති හරය හීන යානයේ දිරාගිය පිට පොත්ත ප්‍රතික්ෂේප කර දමා තිබේ. එසේ කිරීමෙන් ධර්මයේ හරය වන මූල බීජ තම සම්ප්‍රදාය තුළ ආරක්ෂා කර තිබේ.'[11]

ථෙරවාදී මුල් ඇදුරන්ගේ ඉගැන්වීම් මහා සාංඝික ආචාර්යවරුන් පිළිගත් ධර්මය හා සසඳා බලා මෙසේ ලියා තිබේ.

'ථෙරවාදී ආචාර්යවරු තමන් ධර්මය වෙනස් කිරීමට අකමැති පිරිසකැයි කියා ගත්හ. එහෙත් ඔවුන් බුදුන්ගේ මුල් ධර්මය තරමක් දුරට වෙනස් කළහ. එසේ කිරීමේදී තමන්ට මහත්තත්වයක් ආරෝපණය කර ගත්තේය. බුදුරදුන්ටද වැඩි බලතල කායික හා මානසික හැකියාවන් ආරෝපනය කළහ. මහා සාංඝිකවරු තම සභාවලට ගිහි උපාසකවරුද පෘතග්ජන භික්ෂුන්ද සාහභාගි කර ගත්හ.

මහ ජනතාවගේ ආගමික අවශ්‍යතාවන් ගැන සැළකිලිමත් වූහ. ඔවුහු ප්‍රගතිශීලී ප්‍රතිභා පූර්ණ චින්තකයෝ වූහ. මහායානයේ ශාඛා තුනෙන් දෙකක් මහා සාංඝික සම්භවයක් ඇති අය වූහ. එහෙත් වෙනත් ආකාරයෙන් ඔවුන් බුදුරදුන්ගේ මුල් ඉගැන්වීම්වලට ථෙරවාදීන්ට වඩා සමීපව සිටියහ.'[12]

ලොකුම ප්‍රශ්නය වන්නේ බුදුරදුන්ගේ මූලික ඉගැන්වීම කුමක්ද කියාය. එඩ්වඩ් කොන්සේ පඬිවරයා මේ ප්‍රශ්නය වචන ස්වල්පයකින් බැහැර කරයි. 'සිහි බුද්ධිය ඇති කිසිවෙකුට මේ ගැන තීරණාත්මක පිළිතුරක් දිය නොහැක'[13]

මෙම ලිපිය එංගලන්තයේ CURZON PRESS මගින් 1996 දී පළ කරන ලද PALI BUDDHISM ග්‍රන්ථයේ පළ වුණු ලිපියක දල පරිවර්තනයකි.

(මෙය කර්තෘගේ පරිවර්තනයක් නොවේ. මෙහි පරිවර්තකයා අඥාතය. මුල් පිටපත සමග සසඳන විට මෙහි සුලු අඩුපාඩුකම් ඇත.)

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. අංගුත්තර නිකාය ලන්ඩන් P.T.S 1 වන වෙළුම 189 වන පිටුව
2. මජ්ඣිම නිකාය 1 වන වෙළුම 317 වන පිටුව
3. ගුණපාල ධර්මසිරි- A Buddhist Critique fo the Christian Concept of God.
4. ගෝකුලදාස - Democracy in Early Buddhist Sangha
5. අංගුත්තර නිකාය 3 වන වෙළුම 148, 149 පිටු එසේම ලාල්මණිජෝෂි - Discerning the Buddha. Delhi. Manshriram Manoharlal 1983 p.22

   1883 22 වන පිටුව.
6. ගුණපාල ධර්මසිරි - Fundamenttals of Buddhist Ethics

   කැලිෆෝර්නියා- 1989 25 වන පිටුව.
7. ජාතක පොත - බුද්ධවංසය - වේරගොඩ අමරමෝලි හිමි, කොළඹ 1961-7 පිටුව





8. The Buddha in the Crown ජෝන් හෝල්ට් ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයීය මුද්‍රණාලය. 1991
9. ජාතක පොත - බුද්ධවංසය 9 වැනි පිටුව.
10. ලමායසේ - Introuction to Tantra, London, Wisdom Books 1987- 29"30 පිටු.
11. ලාල්මණි ජෝශි - 16 වන පිටුව සංඝරක්ෂිත භික්ෂු - Asurvey of Buddhism - nex.f,darh 1966 - පිටු 117, 187.
12. රිචර්ඩ් ආර් රොබින්සන් - The Buddhist Religion: A Historical Introduction බෙල්මන්ට් 1970 පිටු 37-38- ලාල්මණි ජෝසි පිටු 17.
13. එඩ්වර්ඩ් කොන්සෙ - Thirty years of Buddhist Studies ලන්ඩන් 1976 - 10 වන පිටුව ලාල්මණි ජෝෂි 17 වන පිටුව.